# "වතු සමාජ සංවර්ධන සේවාව" (කොඩෙසෙප් ආයතනය) මගින් ඉටුකරනු ලැබූ සේවාවන්.

2006 වසරේදී ඇරඹි මෙම ව්‍යාපෘතියේ පළමු ක්‍රියාකාරකම වූයේ දකුණු පළාතේ වතුකරයෙන්ම තෝරාගත් සුදුසුකම් ඇති අ.පො.ස.(උ.පෙළ) දක්වා ඉගෙන ගත් තරුණ තරුණියන් 28 දෙනෙකු තෝරාගෙන ඔවුනට අවශ්‍ය පුහුණුවීම් ලබාදී දකුණු පළාතේ උග්‍ර ගුරු හිඟයක් පැවති ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් පත් කිරීමයි.

2007 පෙබරවාරි සිට මේ දක්වා "නවෝදය" ව්‍යාපෘතිය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

*__01. සමාජ සංවර්ධනය වෙනුවෙන් .__*

01. ව්‍යාපෘතියේ පූර්ණ කාලින සේවය සඳහා වතුකරයේ තරුණ තරුණියන් 16 දෙනෙක් තෝරාගෙන ඔවුන්ට සමාජ සජිවීකරණය පිළිබඳ පුහුණුවීම් ලබාදී ඇත.
02. දකුණු පළාතේ වතුකරයේ තෝරාගත් වතු වලට අදාලව පවුල් 15-20 පමණ එකතුකොට කුඩා කණ්ඩායම් 92 පමණ බිහිකිරීම.
03. එම බිහිකරන ලද කණ්ඩායම් වලට අප සජිවකයින් මගින් විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
04. එම කුඩා කණ්ඩායම් වල නායක නායිකාවන් සඳහා නායකත්ව පුහුණුවීම් ලබාදීම.
05. එම කුඩා කණ්ඩායම් වල මව්වරුන් හා පියවරුන් සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
06. "නවෝදය" ව්‍යාපෘතියේ වසර තුනක ඉදිරි සැලසුම සකස් කිරීම.
07. වතු කළමණාකරනයට, වතු කාර්‍යය මණ්ඩලයට, රජයේ නිළධාරීන්ට "නවෝදය" ව්‍යාපෘතිය හඳුන්වාදීම.

*__02. අධ්‍යාපනය සංවර්ධනය වෙනුවෙන්__*

01. දකුණු පළාතේ උග්‍ර ගුරු හිඟයක් පවතින වතු පාසල් සඳහා අප ආයතනය මගින් 2007 වසරේ මුල් මාස 5 තුල ස්වේච්ඡා ගුරුවරුන් 28ක් හා මේ වන විට ස්වේච්ඡා ගුරුවරුන් 16ක් පත්කර ඔවුනට මාසික දීමනාවක් ලබාදීම හා එම ගුරුවරුනට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම.
02. දකුණු පළාතේ වතු පාසල් වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
    - එනසල්වත්ත දෙමළ විදුහලේ ජලනළ පද්ධතියක් ඉදිකිරීම හා ජල ටැංකිය අළුත්වැඩියා කිරීම.
    - එනසල්වත්ත දෙමළ විදුහලට අළුතින් පාසල් උපකරණ ලබාදීම.
    - එනසල්වත්ත දෙමළ විදුහලේ ක්‍රීඩා පිටිය විශාල කිරීම.
    - බෙවරලිය දෙමළ විදුහලේ "ඔලිවිලා" උත්සවය පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම.
    - බෙවරලිය දෙමළ විදුහලට අළුතින් පාසල් උපකරණලබාදීම.
    - අනින්කන්ද දෙමළ විදුහලට අළුතින් පාසල් උපකරණ ලබාදීම.
    - අනින්කන්ද දෙමළ විදුහලේ ක්‍රීඩා පිටිය විශාල කිරීම.
    - අනින්කන්ද දෙමළ විදුහල වටා ආරක්ෂක වැටක් ඉදිකරදීම.

- දෙනියාය ශාන්ත මැතිව් විදුහලේ සංගීත කණ්ඩායමට සමස්ථලංකා තරඟ නියෝජනය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
- දෙනියාය ශාන්ත මැතිව් විදුහලට පාසල් උපකරන ලබාදීම.
- හැන්ෆර්ඩ් දෙමළ විදුහලේ ආරක්‍ෂක බැම්මක් ඉදිකිරීම.
- හැන්ෆර්ඩ් දෙමළ විදුහලට අළුතින් පාසල් උපකරණලබාදීම.
- හැන්ෆර්ඩ් දෙමළ විදුහලේ ක්‍රීඩාපිටිය විශාල කිරීමට අනුග්‍රහය දැක්වීම.
- තලපලකන්ද කනිෂ්ඨ විද්‍යාලයට පුස්තකාල පොත් ලබාදීම.

03. පෙර පාසල් හා සාක්‍ෂරතා පාසල් ආරම්භකරීම හා ඒවා සංවර්ධනය කිරීම.

- විලි ගෘෘප්, එනසල්වත්ත, මොරවක හා සම්බෝධි යන වතු වල සාක්‍ෂරතා පාසල් ක්‍රියාත්මක කිරීම.
- දෙනියාය "කලෙමගල්" පෙර පාසලෙ"කලෙවිලා" සංස්කෘතික උත්සවයක් පැවැත්වීමට මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
- දෙනියාය "කලෙමගල්" පෙර පාසලට උපකරන ලබාදීම.
- වීලි ග්‍රෑප් සෙන්ට් මාග්‍රට් කොටසේ සාක්‍ෂරතා පාසලක් ආරම්භ කිරීම.
- සිරිසිලිය සාක්‍ෂරතා වතු පාසලට පාසල් උපකරණ ලබාදීම.
- දෙණියාය ප්‍රදේශය ආශ්‍රිත වතු වල ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන 16කට පෙර පාසල් උපකරණ ලබාදීම.

04. 2007 වර්ෂයේදී අ.පො.ස.(සා.පෙළ) හදාරන වතුකරයේ සිසුන් දස දෙනෙකුට හා අ.පො.ස.(උ.පෙළ) හදාරන වතුකරයේ සිසුන් සිවුදෙනෙකුට ශිෂ්‍යත්ව ලබාදීම හා 2008 වර්ෂයේදී අ.පො.ස.(සා.පෙළ) හදාරන වතුකරයේ සිසුන් පස් දෙනෙකුට හා අ.පො.ස.(උ.පෙළ) හදාරන වතුකරයේ සිසුන් දහසය දෙනෙකුට ශිෂ්‍යත්ව ලබාදීම.

05. 2007 හා 2008 වර්ෂවල පහ වසර ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් සම්මන්ත්‍රන මාලාවන් පැවැත්වීම.

06. 2007 හා 2008 වසරේදී අ.පො.ස.(සා.පෙළ) විභාගය වෙනුවෙන් සම්මන්ත්‍රන මාලාවන් පැවැත්වීම.

07. මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් වල දුර්වල සිසුන් සඳහා සවස්කාලයේදී උපකාරක පන්ති පැවැත්වීම හා එහි දක්‍ෂ සිසුන්ට ත්‍යාග ලබාදීම.

08. 2007 වසරේ අවසන් වාර විභාගයෙන් දක්‍ෂතා දැක්වූ වතුපාසල් වල සිසුන්ට ත්‍යාග ලබාදීම.

09. 2008 අ.පො.ස.(සා.පෙළ) හදාරන දමිළ මාධ්‍ය සිසුන් සඳහා ගණිතය විශයට විශේෂ උපකාරක පන්තියක් පැවැත්වීම.

10. මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් වල 05 වසර පන්ති භාර ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

<u>*03. සාමය හා සහජීවනය වෙනුවෙන්.*</u>

01. දෙනියාය සර්ව ආගමික පදනම මගින් 2007 හා 2008 වර්ෂවල පවත්වන ලද බක්මහ උළෙල වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය දැක්වීම.

02. 2007 නත්තල් උත්සවය නිමිත්තෙන් එනසල්වත්ත, හැන්ෆර්ඩ්, ඩවුන්සයිඩ්, සෙල්වකන්ද, මොරවක , කිරිවානගඟ හා කොටපොළ යන වතු වල නත්තල් උත්සව පැවැත්වීම.

03. 2008 තෛපොංගල් උත්සවය වෙනුවෙන් එනසල්වත්ත, හැන්ෆර්ඩ්, ඩවුන්සයිඩ්, සෙල්වකන්ද, නිල්ඇල්ල, බෙවර්ලි, දෙනියාය වත්ත , කිරිවානගඟ හා කොටපොළ යන වතුවල තෛපොංගල් උත්සව පැවැත්වීම.

04. වතුකරයේ දරුදැරියන්ගේ සහභාගිත්වයෙන් යුතු තූර්ය වාදක කණ්ඩායමක් පිහිටුවීම.

05. දෙණියාය, කළුගලහේන ශ්‍රී ඉන්ද්‍රාරාම විහාරස්ථානය, හැන්ෆර්ඩ් ශාන්ත ලූක්ස් දේවස්ථානය, දෙණියාය වත්ත ශ්‍රී මුත්තුමාරිඅම්මාන් හින්දු කෝවිල යන ආගමික සිද්ධස්ථාන වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම.

06. කොටපොළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සිංහල හා දමිළ භාෂාවෙන් මුද්‍රිත නාම පුවරු ලබාදීම.

07. දෙනියාය පොලිස් බල ප්‍රදේශයේ සිවිල් ආරක්ෂක කමිටු සඳහා නිල ඇඳුමක් ලබාදීමට අනුග්‍රහය දැක්වීම.

08. වතුකරයේ දරුදැරියන්ගේ කළා කුසලතා ඔප්නැංවීමට "නවෝදය දිනය" නමින් විශේෂ උත්සවයක් පැවැත්වීම.

09. දකුණු පළාතේ වතුකරයේ කතෝලික ජනතාව වෙනුවෙන් ඥානකාන්තියක් පැවැත්වීම.

*<u>04. සෞඛ්‍ය හා සනීපාරක්ෂා සංවර්ධනය වෙනුවෙන්</u>*

01. වතුකරයේ දිළිඳු රෝගී ජනතාව වෙනුවෙන් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම.

02. වතුකරයේ උග්‍ර ජල ප්‍රශ්නයන් පවතින වතුවලට ජල පහසුකම් ලබාදීම.
    - හැන්ෆර්ඩ් වතුයායේ බෝධිය අසල කොටස සඳහා ජල පහසුකම් ලබාදීමට ළිඳක් ඉදිකිරීම.
    - ඩවුන්සයිඩ් කොටසසේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය අසල කොටසට ජල පහසුකම් ලබාදීම සඳහා වතුර ටැංකිය හා ජලනල පද්ධතිය අළුත්වැඩියා කිරීම.
    - එනසල්වත්ත PT කොටසට වතුර ටැංකියක් හා ජලනල පද්ධතියක් ඉදිකිරීම.
    - කළුගලහේන ප්‍රජා ශක්ති පදනම සඳහා වතුර මීටර් 25ක් ලබාගැනීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
    - තැන්නහේන වත්තේ තැන්නහේන කොටස සඳහා ජල ටැංකියක් ඉදිකරදීම.
    - බටහේන වත්තේ ළිඳක් අළුත්වැඩියා කරදීම.
    - සිරිසිලිය වතුයායේ ජළනළ පද්ධතිය අළුත්වැඩියා කරදීම.
    - උග්ගල්කොත වතුයායේ ජළනළ පද්ධතිය අළුත්වැඩියා කරදීම.
    - කිරිවානගඟ ප්‍රධාන කොටසේ ජළනළ පද්ධතිය අළුත්වැඩියා කරදීම.
    - එනසල්වත්ත සෙල්වකන්ද කොටසේ නව ළිඳක් ඉදිකරදීම.
    - විලිගෘප් වතුයායේ සෙන්ට් මාග්‍රට් කොටසේ ජළනළ පද්ධතිය අළුත්වැඩියා කරදීම.

03. පිහිටවූ කුඩා කණ්ඩායම් වල එක් අයකු බැගින් තෝරා ගෙන ස්වේච්ජා සෞඛ්‍ය සේවකයකු වශයෙන් පුහුණු කිරීම.

04. අනින්කන්ද වත්ත, පනිල්කන්ද කොටසේ වෛද්‍ය සායනයක් පැවැත්වීම.

05. පිහිටවූ කුඩා කණ්ඩායම් මාසිකව තම වතු වල ශ්‍රමදාන පැවැත්වීම.

***05. ආර්ථික සංවර්ධනය වෙනුවෙන්.***

01. ඇතිකරන ලද කුඩා කණ්ඩායම් වල ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරීම හා ඒ පිළිබඳ පුහුණුවීම් ලබාදීම.

02. තෝරාගත් වතුවල ගෙවතුවගා ඇතිකිරීම.

03. වතුකරයේ තරුණ තැණියන් සඳහා වෘත්තිය පුහුණුවීම් ලබාදීම.

- වතුකරයේ තරුණියන් 10 දෙනෙකුට මැහුම් පාඨමාලාවකට සහභාගිකරවීම.
- 2007 වසරේ අ.පො.ස. (සා.පෙළ) හදාරා අවසන් කල වතුකරයේ දරුදැරියන් 15දෙනෙකුට පමණ පරිඝනක පුහුණුව ලබාදීම.

***06. ළමා, තරුණ හා කාන්තා සුබසිද්ධිය වෙනුවෙන්.***

01. 2007 හා 2008 වසර වල ජාත්‍යන්තර ළමා දිනය වෙනුවෙන් ළමා දින උත්සවයක් සංවිධානව කිරීම.

02. මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් වල දරුදැරියන් සඳහා කථික, රචනා හා චිත්‍ර තරඟ පැවැත්වීම හා ජයග්‍රාහකයින්ට ත්‍යාග ලබාදීම.

03. වතුකරයේ යෞවන සමාජ 25ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදීම.

අධ්‍යක්ෂක පියතුමා,
"කොඩෙසෙජ්" (නවෝදය) ව්‍යාපෘතිය,
රත්නපුර පාර,
කළුගලහේන
දෙනියාය.

දු. ක. :-041-2273111